සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022**

**Practice Test - Grade 13 - 2022**

# ආර්ථික විද්‍යාව - I

**21 S I**

කාලය: පැය දෙකයි

විභාග අංකය: ..............................................................................

උපදෙස්:-


* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ (1) (2) (3) (4) (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන උත්තර පත්‍රයේ නිවැරදි අංකය මත කතිරය (×) යොදන්න.

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් ආර්ථිකයක විශේෂිත කාර්යභාර්ය වනුයේ,
    1) අවම පිරිවැයක් යටතේ භාණ්ඩ හා සේවා නිපදවීම.
    2) උද්ධමනය පාලනය කිරීම හා රාජ්‍ය අයවැයෙහි, ගෙවුම් ශේෂයෙහි හිඟය අවම කිරීම.
    3) අදාල සමාජයේ මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රවාහයක් බිහි කිරීම.
    4) නිෂ්පාදන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ඉලක්ක නියම කිරීම.
    5) ආදායම් ව්‍යාප්ති විෂමතාව අවම වන සේ සාධාරණ ආදායම් ව්‍යාප්තියක් තහවුරු කිරීම.

02. ආර්ථික විද්‍යාවේ සම්පත් හිගකම යන සංකල්පයෙන් අදහස් වන්නේ.
    1) සාපේක්ෂව සමහර රටවල පවත්නා සම්පත් අඩු බවයි.
    2) පවත්නා සම්පත්වලින් මිනිසුන්ගේ වුවමනා සියල්ල සපුරාගත නොහැකි බවයි.
    3) සම්පත් අසීමිතව පවතින විට අනිවාර්යෙන් තේරීමක් කළ යුතු බවයි.
    4) සෑම සමාජයකම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් ලෙස ජීවත්වන බවයි.
    5) අසීමිත වුවමනාවන්ට අනුව සම්පත් ලැබී ඇති බවයි.

03. සැලසුම්ගත ආර්ථික ක්‍රමයක "කුමක් නිෂ්පාදනය කළ යුතුද" යන ආර්ථික ප්‍රශ්නය තීරණය වනුයේ.
    1) පාරිභෝගිකයින්, සම්පත් හිමිකරුවන් ඒකාබද්ධව ගන්නා තීරණ මඟිනි
    2) පාරිභෝගිකයින් සහ රජය ඒකාබද්ධව ගන්නා තීරණ මඟිනි
    3) පාරිභෝගිකයින් සහ ව්‍යාපාරිකයින් ඒකාබද්ධව ගන්නා තීරණ මඟිනි
    4) පාරිභෝගිකයින්, රජය සහ ව්‍යවසායකයින් ඒකාබද්ධව ගන්නා තීරණ මඟිනි
    5) රජය විසින් දෙනු ලබන නියෝග මඟිනි

04. එක්තරා ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය කාලයත් සමඟ වෙනස් වී ඇති ආකාරය පහත දැක්වෙන රූප සටහනින් පෙන්නුම් කෙරේ.
    නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය $A_1 A_1$ සිට $A_2 A_2$ දක්වා විතැන්වීමට බලපෑ හැකි හේතුව කුමක්ද?




    1) ජනතාවගේ භාණ්ඩ ඉල්ලුම වැඩිවීම
    2) අපනයන ඉපයුම් වැඩිවීම
    3) ජනතාවගේ උද්සෝෂණ හා විරෝධතාවන්
    4) ශ්‍රම ඵලදායිතාව ඉහළ යාම
    5) ආදායම් ව්‍යාප්ති විෂමතාව අඩු වීම

22 A/L අපි [ papers group ]

05. යම් භාණ්ඩයකින් නිශ්චිත මිලකදී පාරිභෝගිකයින් විසින් මිලදී ගැනීමට සැලසුම් කරනු ලබන ප්‍රමාණය.

1) සැමවිටම සමතුලිත ප්‍රමාණයට සමාන වේ
2) ඉල්ලුම් වක්‍රයක් මගින් නිරූපණය වේ
3) ඉල්ලුම් ප්‍රසාරණය වේ.
4) ඉල්ලුම වේ
5) ඉල්ලුම් ප්‍රමාණය වේ

06. අනෙකුත් සාධක නො වෙනස්ව තිබිය දී ගිෆන් භාණ්ඩයක මිල අඩු වන විට

1) එහි සාපේක්ෂ මිල පහළ යන බැවින් ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය අඩු කරයි
2) එහි සාපේක්ෂ මිල වැඩි වන බැවින් ඉල්ලුම වැඩි කරයි
3) ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු කරයි
4) ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම වැඩි කරයි
5) ආදේශන ප්‍රතිවිපාකය විසින් ආදායම් ප්‍රතිවිපාකය නිශේධනය කරන බැවින් ඉල්ලුම් ප්‍රමාණය වැඩි කරයි.

07. වී සඳහා අපේක්ෂිත මිල පහළ වැටෙන අපේක්ෂාවක් පවතී නම් වර්තමානයේ දී.

1) වී මිල ඉහළ යයි.
2) වී ඉල්ලුම වැඩි කරයි.
3) වී සැපයුම් ප්‍රමාණය වැඩි කරයි.
4) වී සැපයුම වැඩි කරයි.
5) වී සැපයුම අඩු කරයි.

08. අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී කිරිපිටි මිල ඉහළ යන විට පාරිභෝගික පැහැදම, කිරි පිටි මිල ඉහළ යන වේගයට වඩා අඩු වේගයකින් වැඩි වේ යැයි සලකන්න. මේ අනුව කිරිපිටි,

1) අත්‍යවශ්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ.
2) සුඛෝපභෝගී භාණ්ඩයකට උදාහරණයක් වේ.
3) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ.
4) බාල භාණ්ඩයකට උදාහරණයක් වේ.
5) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ.


09. හාල් කිලෝවක මිල රුපියල් 90 දී ඉල්ලුම් ප්‍රමාණය කි.ග්‍රෑ.75 කි. එහි මිල රුපියල් 150ක් වූ විට ඉල්ලුම ප්‍රමාණය කි.ග්‍රෑ.45 දක්වා ඉහළ යයි නම් හාල් කිලෝවක මිල රු.90 සිට 150 දක්වා වැඩිවන විට ඒ සඳහා පවත්නා මිල ඉල්ලුම් නම්‍යතාව කොපමණ වේද?

1) -1.2  2) 1. 2  3) -1.0  4) 1.0  5) -0.8

10. හරස් මිල ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගන්නා භාණ්ඩ.

1) සාමාන්‍ය භාණ්ඩ වේ
2) බාල භාණ්ඩ වේ
3) අත්‍යවශ්‍ය භාණ්ඩ වේ
4) ආදේශක භාණ්ඩ වේ
5) අනුපූරක භාණ්ඩ වේ

11. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත ප්‍රස්ථාර සටහන පෙන්නුම් කරයි.




22 A/L අපි [ papers group ]

වෙළෙඳපොළ සමතුලිතයේ දී මෙම භාණ්ඩයෙන් හිමි වන සමස්ත අතිරික්තයේ ප්‍රමාණය කොපමණද?

1) රු. 54  2) රු. 81  3) රු. 135  4) රු. 252  5) රු. 270

12. අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී රසායනික පොහොර තහනම් කිරීම සහ පාන් මිල ඉහළ යාම සහල් වෙළෙඳපොල සමතුලිතය කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කරනු ලබයිද?

| සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය |
|---|---|
| (1) අඩු වේ | අඩු වේ |
| (2) වැඩි වේ | වැඩි වේ |
| (3) වැඩි වේ | අඩු හෝ වැඩි හෝ නොවෙනස්ව පවතී |
| (4) අඩු වේ | අවිනිශ්චිතය |
| (5) වැඩි වේ | අඩු වේ |

13. රජය විසින් ක්‍රියාත්මක කරන පහත සඳහන් කවර මිල පාලන ක්‍රියාමර්ගයක් පාරිභෝගික අතිරික්තය අඩු වී නිෂ්පාදක අතිරික්තය ඉහළ නැංවීමට බැලපෑම් කරනු ලබන්නේ ?

1) සඵල උපරිම මිල ක්‍රියාවට නැංවීම
2) සඵල අවම මිල ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම
3) විශේෂිත බද්දක් පැනවීම
4) නිෂ්පාදන සහනාධාර ලබා දීම
5) ඌණ පූර්ණ ගෙවීම් සහිත මිල ආධාරක ප්‍රතිපත්තිය

14. තරඟකාරී වෙළඳපොලක අලෙවි වන භාණ්ඩයක් සඳහා ඉල්ලුම් සැපයුම් වක්‍ර වලට අදාල සමීකරණ පහත දැක්වේ.

$Qd = 200 - 2P$ $\qquad\qquad$ $Qs = -100 + 4P$

මෙම භාණ්ඩයේ නිෂ්පාදනය මත රුපියල් 6 ක විශේෂිත බද්දක් රජය පනවනු ලැබුව හොත් භාණ්ඩ ඒකකයක් සඳහා ගැනුම්කරුවන් ගෙවන බද්දේ ප්‍රමාණය, ඒකකයකට නිෂ්පාදනයන් ගෙවන බද්දේ ප්‍රමාණය හා බද්දෙන් පසු පරිභෝජන වියදම කොපමණ ද?

| පාරිභෝගිකයා ගෙවන ප්‍රමාණය (රු.) | නිෂ්පාදනයා ගෙවන ප්‍රමාණය (රු.) | බද්දෙන් පසු පරිභෝජන වියදම (රු.) |
|---|---|---|
| (1) 368 | 184 | 4968 |
| (2) 184 | 368 | 5000 |
| (3) 54 | 48 | 5400 |
| (4) 4 | 2 | 4968 |
| (5) 4 | 2 | 5000 |

15. කිසියම් භාණ්ඩයක යම් නිමැවුම් මට්ටමකට අදාළ පිරිවැය දත්ත කිහිපයක් පහත දැක්වේ.

මුළු ස්ථාවර පිරිවැය (TFC) රු. 80.00
සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) රු. 4.00
සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) රු. 16.00

එම තොරතුරු ඇසුරෙන් ඉහත භාණ්ඩවලට අදාළ නිමැවුම් මට්ටම හා මුළු විචල්‍ය පිරිවැය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | නිමැවුම් මට්ටම (Q) | මුළු විචල්‍ය පිරිවැය (TVC) |
|---|---|---|
| (1) | 8 | 40 |
| (2) | 6 | 10 |
| (3) | 5 | 20 |
| (4) | 7 | 15 |
| (5) | 9 | 36 |

22 A/L අපි [ papers group ]

16. නිෂ්පාදන ක්‍රියාවලියේ පරිමාණුකූල ඵල ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදයේ දී.
    1) සියලුම යෙදවුම් ස්ථාවරව පවතී
    2) විචල්‍ය යෙදවුම් වෙනස්විය හැකි වුවද නිමැවුම වෙනස් කළ නොහැක.
    3) අවම වශයෙන් එක් යෙදවුමක් හෝ වෙනස් කළ නොහැක.
    4) සියලුම යෙදවුම් වෙනස් කල හැක.
    5) තාක්ෂණය වෙනස් කළ නොහැක.

17. කෙටිකාලින සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය පහළ බසිමින් පවතින විට
    1) ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට වඩා පහළින් ගමන් කරයි.
    2) ආන්තික පිරිවැය වක්‍රයේ අවම ලක්ෂය ඡේදනය කරමින් සාමාන්‍ය ස්ථාවර පිරිවැය ගමන් කරයි.
    3) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයට ඉහළින් ගමන් කරයි.
    4) සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය තිරස් රේඛාවක් සේ පිහිටයි.
    5) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය ආන්තික පිරිවැය වක්‍රයට වඩා පහළින් ගමන් කරයි.

18. ආර්ථික ලාභය හා නිෂ්පාදන අතිරික්තය අතර වෙනස
    1) මුළු විචල්‍ය පිරිවැයයි  2) මුළු ස්ථාවර පිරිවැයයි  3) සාමාන්‍ය මුළු පිරිවැයයි
    4) ආන්තික පිරිවැයයි  5) සාමාන්‍ය අයභාරයයි

19. යම් කාලච්ඡේදයක් තුළ කිසියම් භුගෝලීය ප්‍රදේශයක සියලු නිෂ්පාදන කටයුතුවල එකතුකළ අගයේ එකතුව හැඳින්වෙන්නේ
    1) දළ ජාතික ආදායම  2) දළ එකතුකළ වටිනාකම  3) මූර්ත ජාතික ආදායම
    4) මුළු කෘෂි නිමැවුම  5) ශුද්ධ දේශීය නිෂ්පාදිතය

20. රවීන්ට දළ ජාතික ආදායමේ අගය සපයා ඇති අතර රවීන් විසින් දළ දේශීය නිෂ්පාදිතයේ අගය ගණනය කළ යුතුය. මේ සඳහා රවීන් විසින් කළයුතු ගැළපීම වන්නේ.
    1) භාණ්ඩ හා සේවා අපනයන අගය එකතු කිරීම  2) විදේශ ශුද්ධ ආයෝජන අඩු කිරීම
    3) භාණ්ඩ හා සේවා ආනයන අගය අඩු කිරීම  4) විදේශ ශුද්ධ ආයෝජන අඩු කිරීම
    5) විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම අඩු කිරීම

21. පහත දැක්වෙන වියදම් වර්ගවලින් කුමක් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුලත් කරන්නේ ද? යන්න හඳුනා ගන්න.
    1) පොහොර සහනාධාර සඳහා ගොවීන්ට මුදල් ගෙවීම
    2) තොග වෙළෙන්දන් නැවත විකිණීම පිණිස පෙර වර්ෂයේ භාණ්ඩ තොගයක් මිලදී ගැනීම
    3) රජය දිළිඳු ජනතාවට නොමිලේ බෙදාදීම සඳහා සෙවිලි තහඩු මිලදී ගැනිම
    4) පැරණි නිවසක් මිලදී ගැනීම
    5) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ සුරැකුම්පත් මිල දී ගැනීම

22. මූලික මිල ගණන් අනුව ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙහි ඇතුළත් නොවන සංරචකය කුමක්ද?
    1) නිෂ්පාදකයාට ලබාදුන් සහානාධාර  2) භාණ්ඩ හා සේවා මත නිෂ්පාදකයාගෙන් අයකල බදු
    3) කෘෂි කාර්මික එකතු කළ අගය  4) සේවා එකතු කළ අගය
    5) කාර්මික එකතු කළ අගය

23. සමාහාර වියදම් ශ්‍රිතය $E = 420 + 0.75y$ වන රාජ්‍ය කටයුතු සහිත ආවෘත ආර්ථිකයක රජයේ මිලදී ගැනීම් රු.මි. 80කින් ඉහළ ගියේ නම් සමතුලිත ජාතික ආදායම.
    1) රු.මි.1680  2) රු.මි.1820  3) රු.මි.1320  4) රු.මි.2000  5) රු.මි.4800

24. පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක සමාහාර වියදම් ආශ්‍රිත ශ්‍රිතයන් කිහිපයකි.

$C = 200 + 0.75yd \qquad I = 200$

$G = 500 \qquad T = 200$

මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම, සමාහාර වියදම ගුණකය හා බදු ගුණකය නිවැරදිව දක්වා ඇති පිළිතුර හඳුනා ගන්න.

| | සමතුලිත නිමැවුම | සමාහාර වියදම් ගුණකය | බදු ගුණකය |
|---|---|---|---|
| (1) | 3000 | 3 | 3 |
| (2) | 2000 | 4 | 3 |
| (3) | 3000 | 4 | 3 |
| (4) | 3000 | 3 | 3 |
| (5) | 5000 | 4 | 3 |

25. විවෘත ආර්ථිකයක ''විදීම්'' නිවැරදිව ඇතුළත් කොට ඇති වරණය කුමක්ද?

22 A/L අපි [ pape

1) ඉතුරුම්, අයෝජන සහ අපනයන
2) අයෝජන, ආනයන සහ අපනයන
3) බදු, ඉතුරුම් සහ ආනයන
4) ආනයන, ආයෝජන සහ රජයේ වියදම්
5) අයෝජන, රජයේ වියදම් සහ අපනයන

26. කුටුම්බවල සමපේක්ෂණ චේතනාවෙන් මුදල් ඉල්ලුම ඉහළ නගිනුයේ.

1) නාමික පොලී අනුපාතිකය පහත වැටෙන විටය
2) නාමික පොලී අනුපාතය ඉහළ යන විටය
3) නාමික ජාතික ආදායම පහත වැටෙන විටය
4) පොදු මිල මට්ටම ඉහළ නගින විටය
5) පිළිණපත් මිල පහත වැටෙන විටය

27. ශ්‍රී ලංකාවේ මූලික උද්මනය ගණනය කිරීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් ඉවත් කරණු ලබන අයිතමයන් වන්නේ.

1) ඉන්ධන මිල හා ජල ගාස්තු වේ.
2) දුම්කොළ හා මධ්‍යසාර මිල ගණන වේ.
3) ආහාර හා බලශක්ති මිල ගණන් වේ.
4) පොලී අනුපාතික හා නිවාස කුලිය වේ.
5) පාරිභෝගික භාණ්ඩ මත පනවනු ලබන වක්‍ර බදු වේ.

28. මුදල් ප්‍රමාණවාදයට අනුව නාමික මුදල් සැපයුම 5%ක වැඩිවීමක් නිසා.

1) මූර්ත නිමැවුම 5%කින් ඉහළ යනු ඇත.
2) පොදු මිල මට්ටම 5% කින් ඉහළ යනු ඇත.
3) පොලි අනුපාතිකය 5%කින් පහත වැටෙනු ඇත.
4) මූර්ත මුදල් සැපයුම 5%කින් ඉහළ යනු ඇත.
5) මුදලේ සංසරණ ප්‍රවේගය 5%කින් පහත වැටෙනු ඇත.

29. ශ්‍රී ලංකා මහ බැංකුව තම මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

1) මිල ස්ථායීතාව හා තිරසර සංවර්ධනය.
2) මිල ස්ථායීතාව හා පූර්ණ සේවා නියුක්තිය.
3) මිල ස්ථායීතාව හා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය.
4) මිල ස්ථායීතාව හා රාජ්‍ය ණය බර අඩුකර ගැනීම.
5) මිල ස්ථායීතාව හා ආදායම් ව්‍යාප්තිය සමානතාවක් ඇති කරගැනීම.

30. අධි සංචිත නොමැතිව කටයුතු කරන වාණිජ බැංකු පද්ධතියක් ක්‍රියාත්මක වන ආර්ථිකයක එක් වාණිජ බැංකුවකට රු. මිලියන 100ක බිල්පත් මහ බැංකුව අලෙවි කළේ යයි සිතන්න. මෙම බැංකුවට නියම කරන ලද සංචිත අනුපාතය 10%කි. බිල්පත් අලෙවියට පෙර බැංකු පද්ධතියේ රු. මි. 5000ක තැන්පතු පැවතියේ නම්, බිල්පත් අලෙවි කිරීමෙන් පසු බැංකු පද්ධතියේ තැන්පතු අඩුවීම සහ ණය අඩුවීම පිළිවෙළින්.
   1) රු. මි. 100 සහ රු. මි. 450 කි.
   2) රු. මි. 1000 සහ රු. මි. 900 කි.
   3) රු. මි. 400 සහ රු. මි. 1000 කි.
   4) රු. මි. 500 සහ රු. මි. 450 කි.
   5) රු. මි. 1000 සහ රු. මි. 500 කි.

31. වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් අතිරේක පාරිභෝගිකයෙකුගේ පරිභෝජනයේ ආන්තික පිරිවැය ශුන්‍ය අගයක් ගැනීමෙන් ගම්‍ය වන්නේ.
   1) පරිභෝජනය සීමා කළ හැකි වීමයි.
   2) අදාල භාණ්ඩය පෞද්ගලික අංශය විශාල වශයෙන් සැපයීමයි.
   3) සම්පත් කාර්යක්ෂමව උපයෝජනය වී තිබීමයි.
   4) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති වීමයි.
   5) සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩුවෙන් පරිභෝජනය කිරීමයි.

32. අභිනව මුදල් වර්ෂයක් සඳහා රජයේ අපේක්ෂිත වියදම් හා ආදායම් ඇතුළත් කරමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ලේඛණය පාර්ලිමේන්තුවෙ අනුමැතිය ලැබීමෙන් පසු හඳුන්වන්නේ.
   1) අතුරු සම්මත ගිණුම වශයෙනි.
   2) විසර්ජන කෙටුම්පත වශයෙනි.
   3) පරිපූරක ඇස්තමේන්තුව වශයෙනි.
   4) අතුරු අයවැය වශයෙනි.
   5) විසර්ජන පනත වශයෙනි.

33. 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නොපියවූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය දළදේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස.
   1) 83.7% කි.
   2) 86.8% කි.
   3) 101.0% කි.
   4) 91.7% කි.
   5) 94.3% කි.


34. 2019 වර්ෂයේ සිදුකළ බදු සංශෝධන වලට යටත්ව 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කර ඇති බදු ආදායම් සංරචකයකි.
   1) එකතු කළ අගය මත බද්ද
   2) නිෂ්පාදන / සුරාබදු
   3) ජාතිය ගොඩනැගීමේ බද්ද
   4) ආදායම් බද්ද
   5) ආනයන බදු

35. මෑත වර්ෂ වල ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ණය ලබාගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන් දෙක වන්නේ.
   1) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා මාර්ග සංවර්ධන අධිකාරියයි.
   2) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සීමාසහිත ලංකා සතොසයි.
   3) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා රාජ්‍ය ඖෂධ සංස්ථාවයි.
   4) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවයි.
   5) ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා සීමාසහිත ලංකා සීනි සමාගමයි.

22 A/L අපි [ papers group ]

36. සමජාතීය සම්පත් ප්‍රමාණයක් යොදා ගනිමින් භාණ්ඩ වර්ග දෙකක් නිපදවන A හා B යන රටවල් වලට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත දැක්වේ.

22 A/L අපි [ papers group ]




ඔබට එකඟවිය හැකි ප්‍රකාශය කුමක්ද?

1) A රට දුරකථන විශේෂීකරණය කළ යුතුය.
2) දුරකථන නිපදවීමේ ලා කිසිඳු රටකට නිරපේක්ෂ වාසියෙක් අත් නොවේ.
3) විදුලි පංකා නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය B රටට හිමි වේ.
4) දුකරථන නිපදවීමේ නිරපේක්ෂ වාසිය A රටට හිමි වේ.
5) විදුලි පංකා නිපදවීමේ ලා සාපේක්ෂ වාසිය කිසිදු රටකට හිමි නොවේ.

37. ශ්‍රී ලංකාවේ ආනයන සංයුතියෙහි මෑත කාලීන (2020) තත්වය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | පාරිභෝගික භාණ්ඩ | අන්තර් භාණ්ඩ | ආයෝජන භාණ්ඩ |
|---|---|---|---|
| (1) | 23% | 58% | 19% |
| (2) | 21% | 57% | 22% |
| (3) | 24% | 56% | 20% |
| (4) | 25% | 52% | 23% |
| (5) | 28% | 48% | 24% |


38. කිසියම් වර්ෂයක අපනයන මිල දර්ශකය 20%කින් ඉහළ ගොස් ආනයන මිල දර්ශකය 20% කින් පහළ ගොස් ඇත්නම් අදාල වර්ෂයේ වෙළෙඳ අනුපාතය කොපමණද?

1) 125 2) 140 3) 145
4) 150 5) 180

39. කිසියම් කාලච්ඡේදයකදී ආර්ථිකයක් සතු දළ නිල සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන 6000කි. වාර්ෂික ආනයන වියදම ඩොලර් මිලියන 18000 කි. මෙම ආර්ථිකයේ ආනයන ශක්‍යතාව කොපමණද?

1) මාස 4 2) මාස 3 3) මාස 1.2
4) මාස 12 5) මාස 6

40. විදේශ විනිමය වෙළෙඳපලේ විදේශ විනිමය හුවමාරුවට අදාල ඉල්ලුම් සැපයුම් වක්‍ර පහත රූප සටහන මඟින් පෙන්නුම් කරයි. ඉල්ලුම් වක්‍රය $D_0$ සිට $D_1$ දක්වා විතැන්වීමක් සිදුවූයේ යයි සිතන්න. එයට හේතු වන්නට ඇත්තේ කුමක්ද?




1) අපනයන වැඩිවීම
2) විදේශ ණය ලැබීම් වැඩිවීම
3) විදේශ ණය පොලී ගෙවීම් වැඩිවීම
4) විදේශ සංක්‍රාම ගෙවීම් අඩු වීම
5) විදේශ සංචාර ලැබීම් වැඩිවීම

41. වර්මානයේ විශේෂ ගැනුම් හිමිකම් (SDR) ඒකකයක වටිනාකම ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක 5ක බර තැබූ වටිනාකම මඟින් සමන්විත වේ. ඊට ඇතුළත් නොවන මුදල් වර්ගය කුමක්ද?
   1) චීන යුආන්ය.  2) බ්‍රිතාන්‍ය පවුමය  3) යුරෝ
   4) ස්විස් ෆ්‍රෑන්ක්ය  5) ජපන් යෙන්ය

42. රටක ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමට ඇතුළත් නොවන අයිතමය වන්නේ.
   1) ඉන්දියාවෙන් දෙනු ලැබූ පරිත්‍යාග
   2) විදේශ සුරැකුම්පත් මිලට ගැනීම
   3) ශ්‍රී ලාංකිකයින් විදේශ ආයෝජන තුලින් උපයාගත් ලාභ
   4) විදේශ ණය සඳහා ගෙවන ලද පොලී
   5) අදෘශ්‍ය අපනයන

43. ආර්ථික වර්ධනයේ පිරිවැයක් ලෙස සැලකිය නොහැක්කේ.
   1) වර්තමාන පරිභෝජනය පහළ යාම  2) ආදායම් ව්‍යාප්තියේ විෂමතාව
   3) උද්ධමන පීඩනයක් ඇති වීම  4) දරිද්‍රතාව ඉහළ යාම
   5) පාරිසරික ගැටලු වැඩි වීම

44. පහත සඳහන් සාධක අතුරින් ආර්ථික වර්ධනය කෙරේ හිතකර බලපෑමක් ඇති කරන සාධකය කුමක්ද?
   1) මුදල් සැපයුම ප්‍රසාරණය  2) පොලී අනුපාතය ඉහළ යාම
   3) සාධක ඵලදායිතාව ඉහළ යාම  4) මුදලේ බාහිර අගය ඉහළ යාම
   5) සේවා වියුක්තිය ඉහළ යාම

45. 2020 ජූලි 01 ලෝක බැංකුවේ නිර්ණායක අනුව ඒක පුද්ගල දළ ජාතික ආදායම අනුව රටවල් වර්ග කිරීමේදී පහළ මැදි ආදායම් ලබන රටවල් අයත් වන සීමාව වන්නේ.
   1) ඇ. එ. ජ. ඩොලර් 1026 - 3995  2) ඇ. එ. ජ. ඩොලර් 1036 - 4045
   3) ඇ. එ. ජ. ඩොලර් 1046 - 4325  4) ඇ. එ. ජ. ඩොලර් 1016 - 2995
   5) ඇ. එ. ජ. ඩොලර් 1056 - 3965

46. ජනගහනයෙන් එක් කොටසකගේ සමාජ ආර්ථික තත්වය තවත් ජන කොටසකගේ ජීවන තත්වයට වඩා අඩුනම් ඉන් අදහස් වන්නේ එම සමාජය තුළ.
   1) ආදායම් දරිද්‍රතාවයයි.  2) මානව දරිද්‍රතාවයයි.
   3) නිරපේක්ෂ දරිද්‍රතාවයයි.  4) ජනගහන දරිද්‍රතාවයයි.
   5) සාපේක්ෂ දරිද්‍රතාවයයි.

47. 2020 මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය වැඩිම සහ අඩුම දිස්ත්‍රික්කයන් වන්නේ. (පිළිවෙලින්)
   1) ගම්පහ - වවුනියාව  2) කොළඹ - මුලතිව්  3) කොළඹ - කිලිනොච්චිය
   4) ගම්පහ - මන්නාරම  5) කොළඹ - මන්නාරම

48. කිසියම් කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළෙඳපොළ දත්ත පහත වගුව පෙන්නුම් කරයි.

| වර්ෂය | සේවානියුක්ත ජනගහනය (මිලියන) | ශ්‍රම හමුදාව (මිලියන) | වයස අවු. 15 හා ඊට වැඩි කුටුම්භ ජනගහනය (මිලියන) |
|---|---|---|---|
| 2019 | 27 | 30 | 60 |
| 2020 | 32 | 36 | 80 |

22 A/L අපි [ papers group ]

ඉහත දත්ත පදනම් කර ගනිමින් පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?

1) ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 2020 වර්ෂයට වඩා 2019 වර්ෂයේදී පහළ අගයක් ගෙන ඇත.
2) 2020 වර්ෂයේ විරැකියා අනුපාතිකය 2019ට සාපේක්ෂව වැඩි වී ඇත.
3) 2020 වර්ෂයේ විරැකියා අනුපාතිකය 10%කි.
4) 2019 වර්ෂයේ හා 2020 වර්ෂයේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය එකම අගයක් ගෙන ඇත.
5) 2019 හා 2020 වර්ෂ දෙකෙහිම විරැකියා අනුපාතිකය එකම අගයක් ගෙන ඇත.

49. 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශය දක්වන දායකත්වය හා මුළු සේවා නියුක්තියට කෘෂි අංශයෙන් දක්වන දායකත්වය නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

| | ද. දේ. නිෂ්පාදිතයට දක්වන දායකත්වය | සේවා නියුක්තියට දක්වන දායකත්වය (%) |
|---|---|---|
| (1) | 7. 0 | 27. 1 |
| (2) | 6. 9 | 25. 3 |
| (3) | 7. 1 | 26. 9 |
| (4) | 7. 2 | 27. 6 |
| (5) | 6. 8 | 27. 1 |

50. වර්තමානයේ (2020) දකුණු ආසියානු කලාපය තුළ ඉහළම විදේශ සේවා නියුක්ති ප්‍රේෂණ ඉපයුම් ප්‍රමාණයකට හිමිකම් කියන රට කුමක්ද?

1) ශ්‍රී ලංකාව
2) ඉන්දියාව
3) මාලදිවයින
4) බංග්ලාදේශය
5) නේපාලය

22 A/L අපි [ papers group ]